සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

## පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

II පත්‍රය

නැණ ලොවට පා නඟන හපනුන්ට මඟ කියන

# "අදිති"

4

පැය 01 යි මිනි 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | <br>V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | <br>V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | <br>V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | <br>V/I/S/CH |

**01. ඡේදය කියවා ඡේදය ඇසුරින් ම පිළිතුරු සපයන්න.**

ස්කැන්ඩිනේවියානු ජාතික ඔල්සන් අපේ කණ්ඩායමේ සිටි දක්ෂ ම කෙනෙක්, ගුරුත්වය රහිත අවකාශයේ නිදහස් පහළට වැටෙන යෝධ වානේ බාල්ක එක්තරා රටාවකට අනුව නියම තැනට සවි කරන ආකාරය මට පෙනුණේ කුඩා ළමයින් විවිධ කෑලි එකතු කර සෙල්ලම් බඩු සාදන්නා වගෙයි. එය ඉතා පරෙස්සමින් මෙන්ම සැලකිල්ලෙන් කළ යුතු දෙයක්. අනෙක් අතට අභ්‍යාවකාශ ඇඳුමක් ඇඳ ගෙන වැඩ කිරීම එතරම් පහසු දෙයක් නොවෙයි. කෙසේ වෙතත් පොළොවෙහි උස ගොඩනැගිලි ඉදි කරන්නන්ට නැති එක් වාසියක් ඔවුන්ට තිබිණි . එනම් ඔවුන්ට අවශ්‍ය ඕනෑම වේලාවක තම නිර්මාණයෙන් ඈතට ගොස් ඒ දෙස බලන්නට පුළුවන් වීමයි.

1. ඔල්සන් කුමන ජාතිකයෙක් ද? ..........................................................................
2. මෙහි සඳහන් පොළොවෙහි උස ගොඩනැගිලි ඉදි කරන්නන්ට නොමැති අභ්‍යාවකාශයේ අයට ඇති වාසිය කුමක් ද? ..................................................
3. 'විශාලය' යන අදහස දීමට ඡේදයේ ඇති වචනය කුමක් ද? ............................................
4. මහාප්‍රාණ අරක් සහිත පදයක් තෝරා ලියන්න ? ..................................................
5. මෙහි සදහන් ආකාරයට එතරම් පහසු දෙයක් <u>නොවනනේ</u> කුමක් ද? ..................................................
6. මෙහි සඳහන් උපමාවක් තෝරා ලියන්න ..................................................

**02. පහත වැකිවල හිස්තැනට ගැළපෙන වචනය යටින් ඉරක් අඳින්න.**

1. කැටේට සල්ලි දානවා , මිනිය ......................(වල/වළ)දානවා යැයි කියන විට මෙනි.
2. අම්මා අතරමගදී කෑමට .................... (අග්ගලා/අග්ගළා) සෑදුවාය.
3. ..................(නෙලුම් /නෙළුම්) කවි ඉතා මිහිරිය.

**03. පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් වැරදි (×)ලකුණ ද යොදන්න.**

1. කාන්තාවක යනු උක්ත පදයකි. ( )
2. ගුරුවරු යනු ප්‍රාණවාචි බහුවචන උක්ත පදයකි. ( )

**04. පහත ප්‍රස්තාර පිරුළහි හිස්තැන් පුරවන්න.**

1. ආඬි හත්දෙනාගේ .........................වගේ

**05. 'අකුරක් නෑර' යන්නෙහි අර්ථය ලියන්න.**

..........................................................................................................

**06. පහත වචනවල අදහස ලියන්න.**

1. ස්වේච්ඡාවෙන් ..........................................................................................
2. අබිමුවට ..........................................................................................

**07. පහත වැකියට ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

ඒ තමයි දුම්රිය නියාමක ආච්චි අම්මා පැවසුවා ය.

..........................................................................................................

**08. පහත පද ගලපා අර්ථවත් වැකියක් ගොඩගන්න.**

වූයෙමු /නංගීත් /කියා/විනෝද / තාලයට /මමත් /ඒ /වාක්‍යයක්/නිවේදනයේ /දෙකක්

..........................................................................................................................................................

**09. පහත තේරවිලි විසන්න.**

1. නූල් බැදි අහස් යානාව ..................................................
2. ගජනාල ..................................................

**10. ඉරි ඇඳි පදයට සමාන පදයක් ලියන්න.**

හිමිදිරියේ එළිය කියා රැවටෙති කකුළෝ ................................................


**11. පහත වැකිවල හිස්තැනට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

1. මුව රැල දිය .......................... ( බොති / බොයි )
2. දිය පහර වේගයෙන් ............................(ගැලූහ/ ගැලුවේ ය)
3. තරු අහසේ ....................... (පායයි/ පායති )
4. විදුහල්පති තුමිය අවවාද .......................( දුන්නාය / දුන්නේ ය)

12. ආදරණීය මගේ ගුරුතුමා/ගුරුතුමිය යන මාතෘකාව යටතේ නිර්මාණාත්මක වගන්ති තුන ලියන්න.(එක් වැකියකට වචන පහකට වැඩි විය යුතු අතර උක්ත අඛ්‍යාත නිවැරදි විය යුතුය

1. ...........................................................................................................................................
...........................................................................................................................................
2. ...........................................................................................................................................
...........................................................................................................................................
3. ...........................................................................................................................................
...........................................................................................................................................

**13. පහත රූපවල නම් ඉංග්‍රීසි බසින් ලියන්න.**





1. .................................................. 2. ..................................................

**14. පහත වැකි ගලපා නිවැරදි වැකි ගොඩනගන්න.**

1. Canteen / the/ am/ going/ I/ to

.....................................................................................................

2. your/ pencil ? / Is / this

.....................................................................................................

**15. පහත සිංහල වැකියේ අර්ථයේ දෙමළ බසින් කියන ආකාර සිංහල අකුරින් ලියන්න.**

අම්මා , මල්ලී කෝ ? .....................................................................................................

**16. පහත දෙමළ වචනවල අදහස සිංහල බසින් ලියන්න.**

1. මේසෙ ..................................................
2. පූනෛ කීලේ ..................................................

**17. දෙමළ වැකියේ අදහස සිංහල බසින් ලියන්න.**

ඉදෝ මාම් පලම් ..................................................

18. 23630 ට එකක් අඩු සංඛ්‍යාව අකුරින් ලියන්න. ......................................................................

19. ගැමුණු පාසලේ ළමුන් 3209 ගජබා පාසලේ ළමුන් 1267ක් ද ඇත. පාසල් දෙකේ ම ඇති ළමුන් ගණන කීය ද? ..................................................

20. ගොවිපළක මිරිස් ගස් 105ක් තිබුණි. ඉන් 39 මැරුණි. ඉතිරි මිරිස් ගස් ප්‍රමාණය සොයන්න. ..................................................


21. සිසුන් 124 දෙනෙකුට පොත් 5 බැගින් දීමට අවශ්‍ය පොත් ගණන කීය ද? .......................

22. රටාව හඳුනාගෙන හිස්තැන් පුරවන්න.

1. 2, 3, 5, 8, ................ 2. 20, 11, 31, 22, 42, ..................


23. පැන්සල් 505ක් ළමයෙකුට 5 බැගින් කී දෙනෙකුට බෙදිය හැකි ද? ....................................

24. පහත රූපයේ ඇති මල් ගණන රෝම ඉලක්කමෙන් ලියන්න




..................................................

25.




1.අඳුරු කළ කොටස රූපයෙන් කවර භාගයක් ද?

.....................................

2.අඳුරු කළ කොටස දශම සංඛ්‍යාවක් ලෙස ලියන්න.

.....................................


26. 

1. මෙම ඝන වස්තුව නම් කරන්න. ......................................
2. එම ඝන වස්තුව ඇසුරින් පහත වගුව පුරවන්න.

| මුහුණත් | දාර | ශීර්ෂ ගණන |
|---|---|---|
| | | |


27. කුඩා භාජනයකට ජලය $2l$ 60 $ml$ ප්‍රමාණයක් අල්ලයි. එම භාජනයෙන් 10 වාරයක් විශාල භාජනයකට දමන ලදී. එහි ඇති ජල ප්‍රමාණය කොපමණ ද?......................................

28. පහත දැක්වෙනුයේ වෙළඳ සැලක දිනයක් තුළ අලෙවි කළ එළවළු ප්‍රමාණයක් පිළිබඳ අසම්පූර්ණ ප්‍රස්තාරයකි.




1. වැඩියෙන් ම අලෙවි වූ හා අඩුවෙන් ම අලෙවි වූ ප්‍රමාණ අතර වෙනස කොපමණ ද? .................................................
2. කැරට් හා බිට්රූට් අලෙවියේ වෙනස කීය ද? .................................................

29. පහත රූපයේ සමමිතික රේඛා සියල්ල අඳින්න




30. පෙරවරු 9.10ට පුස්තකාලයට ඇතුළු වූ කිත්මා ප.ව.1.45ට එයින් පිටවිය.

1. ඇය පුස්තකාලයට ඇතුළු වූ වේලාව සම්මත ක්‍රමයට ලියන්න. ....................................
2. ඇය පුස්තකාලයේ ගත කළ කාලය කොපමණ ද? .................................................

31. අඹ වෙළෙන්දෙන් අඹ ගෙඩි 300 පළමු දියේ 1/2ක් ද දෙවන දිනයේ ඉතිරියේ 1/4 ද අලෙවි කළ පසු ඉතුරු ගෙඩි ගණන කීය ද?.................................................


32. 1kg ක් රුපියල් 200.00 බැගින් සීනි 1kg 500g ක් ද, 1kg ක් රුපියල් 260.00 බැගින් පරිප්පු 1kg 750g ක් මිල දී ගත් අයෙක් ගෙවිය යුතු මුදල කීය ද?....................................

- **33.සිට 61 තෙක් ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

33. හොඳ දරුවකු වෙන්න මට පුළුවන්, මෙය සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමට අනුව,
    1. මම මේ ලෙස උදම් වන අවස්ථාවකි,
    2. මම මේ ලෙස ප්‍රාර්ථනා කරන අවස්ථාවකි.
    3. මම මේ ලෙස අධිෂ්ඨානය කර ගන්නා අවස්ථාවකි.
34. අපට අවේණික සටන් ක්‍රමයකි,
    1. කරාටේ 2. අංගම් පොර 3. දුනු ශිල්ප
35. පස සාරවත් කිරීමට උදවු වන සතෙකි,
    1. ගැඩවිලා 2. කපුටා 3. ගිරවා
36. අවුරුද්දේ සෑම දිනකම දැකගත හැකි මලක් නොවන්නේ,
    1. පොල් 2. වදමල 3. ඇහැළ මල
37. මුදුන් මුලක් නැති ශාකයකි.
    1. ගස්ලබු 2. පොල් 3. රඹුටන්
38. ශක්ති ජනක ආහාරයක් වන්නේ,
    1. කඩල 2. මුං ඇට 3. දෙල්
39. නිල් හා රතු වර්ණ මිශ්‍ර කිරීමෙන සෑදෙන වර්ණය කුමක් ද?
    1. තැඹිලි 2. දම් 3. ලා කහ
40. මාලිමාවක කටුව සඳහා යෙදාගෙන ඇත්තේ,
    1. රතු හා නිල් පැහැති ලෝහ පටියක්
    2. දණ්ඩ චුම්බකයි
    3. ප්ලාස්ටික් කැබැල්ලක්
41. කෘමි සත්ත්වයකු නොවන්නේ,
    1. සමනලයා 2. මී මැස්සා 3. මකුළුවා
42. පොදු ප්‍රවාහනවල ආසන වෙන් කර ඇත්තේ,
    1. පාසල් ළමුන් සඳහා 2. ගැබිනි මාතාවන් සඳහා 3. වැඩිහිටියන් සඳහා
43. සුළං දිශා දර්ශකයේ හී හිස හැම විටම යොමු වී ඇත්තේ,
    1. සුළං හමා යන දිශාවට ය.
    2. සුළං හමා එන දිශාවට ය.
    3. ඊසාන දිශාවට ය.
44. 

මෙම සරල යන්ත්‍රයේ බලය යොදන ස්ථානය වන්නේ,
    1. A
    2. B
    3. C

**45.**



**මෙම සිතියමේ වර්ණ කර ඇති පළාත වන්නේ,**

1. **බස්නාහිර පළාත**
2. **නැගෙනහිර පළාත**
3. **දකුණු පළාත**

46. මාර්ග දක්වා ඇති සිතියමක අධිවේගී මාර්ගවල යොදා ඇති වර්ණය වන්නේ,

1. රතු වර්ණය    2. දම් වර්ණය    3. කළු වර්ණය

47. මූලික අවශ්‍යතා පමණක් අඩංගුවන පිළිතුර වන්නේ,

1. ජලය, ආහාර, ඇඳුම් පැළඳුම්
2. රූපවාහිනි, ප්‍රවාහනය, ජලය
3. දුරකථනය, පරිගණකය, යතුරු පැදිය

48. කඩොලාන ශාක පිහිටා ඇති ප්‍රදේශ අයත් වන්නේ,

1. මධ්‍යම කඳුකර ප්‍රදේශවලට
2. මුහුදු කලපු ආශ්‍රිත ප්‍රදේශවලට
3. රට මැද තැනිතලා ප(දේශවලට

49. ආහාර කල්තබා ගැනීමේ වැදගත් කමක් වන්නේ,

1. ආහාර නරක් වීම
2. ආනාගතයේ ප්‍රායෝජනයට ගත හැකි වීම
3. ඉහළ මිලකට විකුණා ගත හැකි වීම


50. ශ්‍රී ලංකාව තුළ හදිසි ගිලන්රථ සේවාවයක් ලබා ගැනීමට ඇමතිය යුතු දුරකථන අංක වන්නේ,

1. 119    2. 1990    3. 1929

51. ගජගා සහ හනුමා වන්නම්වලින් කියැවෙන සත්ත්ව චර්යාව වන්නේ,

1. අශ්වයා - හාවා    2. ඇතා - අශ්වයා    3. ඇතා - වඳුරා

52. පහත දැක්වෙන උපකරණ අයත්වන කර්මාන්තය කුමක් ද?



1. පතල් කර්මාන්තය
2. ධීවර කර්මාන්තය
3. කම්මල් කර්මාන්තය

53. ලෝක උරුමයක් වූ ගාලු කොටුව ඉදි කරන ලද්දේ,

1. ඉංග්‍රීසින් 2. ලන්දේසී 3. පෘතුගීසින්

54. කරල් හටගන්නා වැලක් නොවේ.

1. වට්ටක්කා 2. මෑ 3. දඹල

55. අමධ්‍යප ව්‍යාපාරයේ නිර්මාතෘ ලෙස සැලකෙන්නේ,

1. ශ්‍රීමත් ඩී.බී. ජයතිලක මහතා
2. ආචාර්ය සී.ඩබ්ලිව්. ඩබ්ලිව් කන්නන්ගර මහතා
3. ආචාර්ය ටී.බී.ජයා මහතා


56. සන්නිවේදනයේ ප්‍රධාන අංගවලට අයත් නොවේ.

1. යවන්නා 2. ලබන්නා 3. දුරකථනය

57. හොඳ ආහාර වේලක තිබිය යුතු ලක්ෂණයක් නොවන්නේ,

1. කෘත්‍රිම අසාකාරක යෙදීම
2. පෝෂ්‍ය පදාර්ථ අඩංගුවීම
3. රසවත්වත් බව

58. රූපයේ දැක්වෙන බල්බ වර්ගය වන්නේ,



1. CFL බල්බ
2. LED බල්බ
3. විදුලි පන්දම් බල්බ

59. බල්ලකු සපා කෑ විට පළමුවෙන් ම කළ යුත්තේ,

1. සපා කෑ ස්ථානය රෙදිපටිවලින් වෙලීම
2. සපා කෑ ස්ථානය ගලායන පිරිසිදු ජලයෙන් සේදීම
3. රෝගියාගේ හිස පහලට හරවා තැබීම.

60. වගාවන්ට යොදන රසායනික පොහොර නිසා ඉතා ඉක්මනින් විනාශ විය හැකි සතෙකි.

1. මී මැස්සා 2. ගැඩවිලා 3. සමනලයා

61. යම් වස්තුවක් දෙස බැලීමෙන් යටිකුරු රූපයක් දැක ගත හැක්කේ මින් කුමකින් බැලු විට ද?

1. අත්කාචය 2. අන්වීක්ෂය 3. සිදුරු කැමරාව

62. වියළි කලාපීය ශාඛවල දැක ගත හැකි ලක්ෂණයක් වන්නේ,

1. කටු සහිත වීම.
2. තද කොළ පැහැති වීම.
3. හොඳින් අතු විහිදී තිබීම.